**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය - 2016**

**-------------------------------------------------------------**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 28 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(ඕ) වගන්තිය ප්‍රකාර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම.**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

(i) 2010 හා 2011 වර්ෂවල කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ අරමුදලින්, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ලබා දුන් රු.365,724,524 ක ණය මුදල හා පරිපාලන වියදම් දැරීම සඳහා පෙර වර්ෂවලදී ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවලට ලබා දී තිබුණු පිළිවෙලින් රු.85,512,906 හා රු.21,842,502 ක ණය මුදල් මාස 12 ක් තුළ නොපියවන නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ඉදිරිපත් කර තිබුණි.

(ii) ජාතික රක්ෂණ භාරකාර අරමුදලින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ අරමුදල වෙත සමාලෝචිත වර්ෂයේ දී වී ගොවීන් වෙත වන්දි ගෙවීම සඳහා ලබාදුන් රු.100,000,000 ක මුදල සම්බන්ධයෙන් ගිණුම් සටහන් මගින් අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.20,999,567 ක්වූ මෝටර් රථ 14 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සමඟ ඇති සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමිතයේ 17,18,19 වගන්ති ප්‍රකාරව සිදු කළ යුතු හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

ගොවීන්ගේ මරණ පාරිතෝෂිත අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.14,907,330 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණ ද සත්‍ය ගොවි දායකයින් පිළිබඳව ආයුගණක තක්සේරුවක් සිදුකර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් රු.3,950,634 ක් ලෙස ගිණුමේ සටහන් වී තිබුණද නියැදි පදනම මත ගෙවීම් වවුචර් පරීක්ෂාවේ දී එය රු.4,118,005 ක් බව තහවුරු විය. ඒ අනුව උපචිත වියදම් රු.167,371 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ගොවි විශ්‍රාම වැටුප් හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම විගණනය කිරීම වෙනුවෙන් ගෙවන ලද විගණන ගාස්තු රු.925,074 ක් කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයේ ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුමට හර කිරීම නිසා ගෙවිය යුතු විගණන ගාස්තු එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) උපලේඛනය අනුව ශේෂය රු.55,700 ක් වූ ඉන්ධන අත්තිකාරම් ජංගම වත්කම් යටතේ රු.95,920 ක් ලෙස සටහන් කර තිබීමෙන් ජංගම වත්කම් රු.40,220 ක් වැඩියෙන් පෙන්වා තිබිණි.

(ඇ) ජාතික රක්ෂණ භාර අරමුදලේ මුදලින් ගෙවන ලද වන්දි ප්‍රමාණයට සාපේක්ෂව සියයට 10 ක් යෝජනා ක්‍රමයේ මෙහෙයුම් වියදම් ලෙස ලබා ගැනීමට ලබාදී තිබූ අනුමැතිය මත 2017 ජුනි 12 දින වන විටත් නොගෙවූ රු.16,693,960 ක වන්දි මුදලක් වෙනුවෙන් සියයට 10 ක මෙහෙයුම් වියදම් ගණනය කර රු.1,669,396 ක් යෝජනා ක්‍රමයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

වටිනාකම රු.10,839,821 ක් වූ ලැබිය යුතු රක්ෂණ වාරික මුදල් හා වටිනාකම රු.165,130 ක් වූ ගෙවිය යුතු විවිධ ණය හිමියෝ සනාථ කර ගැනීම සඳහා උපලේඛණ විගණනයට ඉදිරිපත් නොවුණි**.**

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.676,104 ක් වූ සේවක ණය සහ අත්තිකාරම් වසර 5 – 25 අතර කාලයක සිට අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල ඉදිරියට එමින් පවතී. මෙම ණය ශේෂයන් සේවක පාරිතෝෂිතයෙන් හෝ ඇප කරුවන්ගෙන් කාලීනව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු.708,347 ක ලැබිය යුතු ශේෂයක් නිරවුල් නොවී වසර 5 – 12 අතර කාලයක සිට ඉදිරියට එමින් පැවතුණි.

(ඇ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මඟින් ගොවි විශ්‍රාම වැටුප් දායක මුදල් අය කිරීමේදී රක්ෂණය සඳහා කන්නයකට රු.30 බැගින් අය කරන ලද රක්ෂණ මුදල් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් එසේ නොකිරීම මත සමාලෝචිත වර්ෂය අවසන් දිනට එකතුව රු.176,242,010 ක්වූ ලැබිය යුතු රක්ෂණ වාර මුදල යෝජනා ක්‍රමය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදි නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371 | (i) තත්කාර්ය අතුරු අග්‍රිමයක උපරිම සීමාව රු.100,000 ක් වුවද එකී සීමාව නොසලකා රු.140,000 සිට රු.198,000 දක්වා පරාසයක අත්තිකාරම් ලබා දුන් අවස්ථා 06 ක් නිරීක්ෂණය විය.<br><br>(ii) අත්තිකාරම් ලබා ගැනීමේ දී වැය ඇස්තමේන්තුවක් සකස් කිරීමකින් තොරව අත්තිකාරම් ගැනීම නිසා ලබාගත් මුදලින් සියයට 36 සිට සියයට 81 දක්වා ප්‍රමාණයක් නිෂ්කාර්යව දින 10 සිට දින 28 දක්වා කාලයක් අත රඳවාගෙන සිට නැවත පිය වූ අවස්ථා 10 ක් නිරීක්ෂණය විය. |
| (ආ) | 2010 මාර්තු 30 දිනැති අංක ඩීඑම්එස්/34 (ii) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය. | චක්‍රලේඛයට පටහැනි ලෙස 2009 දෙසැම්බර් 29 දින පැවති 414 වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත මණ්ඩලයේ සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට ක්ෂේත්‍රයේ රාජකාරීවල නිරත වීමේ දී දිනකට රු.2500 ක උපරිමයකට යටත්ව යැපීම් දීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය.

### 3.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රතිඵලය රු.355,825,300 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,768,542 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.347,056,758 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව කෙතට අරුණ පොහොර සහනාධාර වැඩ සටහනේ වන්දි ගෙවීම් රු.749,885,081 කින් අඩුවීම හා ආයෝජන ආදායම් රු.26,609,567 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍යාමය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 හා 2013 වර්ෂවල දී ඌනතාවන් ද අනෙකුත් වර්ෂවලදී මූල්‍ය අතිරික්තයක්ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේ රු.**36**,411,337 ක් වූ ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේද රු.25,696,859 ක සෘණ අගයක් වී 2016 වර්ෂය වන විට රු.442,624,561 ක් දක්වා අඛණ්ඩ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය.

### 4.1 කාර්යසාධනය.

කෘෂිකාර්මික, උද්‍යාන භෝග හා ඖෂධීය පැළෑටි, පශු සම්පත්, ධීවර හා වන වගාව, කෘෂි උපකරණ රක්ෂණය කිරීම හා ගබඩා කිරීම, කෘෂිකාර්මික හා උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන, ඖෂධීය පැළෑටි නිෂ්පාදනය, ධීවර හා වන නිෂ්පාදන සම්බන්ධයෙන් කෘෂිකාර්මිකයන්ගේ ප්‍රතිලාභය උදෙසා වෛද්‍ය ප්‍රතිලාභ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිහිටුවා ක්‍රියාත්මක කිරීම යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණු වේ.

මෙම අරමුණු ලඟා කර ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

(i) පශු සම්පත්,තොග, කෘෂි උපකරණ, සුවසෙත හා තෙවන පාර්ශව රක්ෂණ ක්‍රම වල භෞතික හා මූල්‍ය ඉලක්ක ඉටුකර ගැනීම සියයට 50 ට වඩා අඩු මට්ටමක් ගෙන තිබුණි.

(ii) ධීවර සහ වන වගා නිෂ්පාදනයට රක්ෂණය ආරම්භ කිරීම තුළින් ගොවීන්ට සෙත සැලසීම පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(iii) තරඟකාරී නව රක්ෂණ ක්‍රම අවශ්‍යතා හඳුනාගැනීම හා නව රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(iv) වාණිජ බැංකු විසින් කෘෂිකාර්මිකයාට ලබාදෙන ණය යෝජනා ක්‍රම අධ්‍යයනය කර වඩා ඵලදායී රක්ෂණ ක්‍රම හඳුන්වා දී ගොවීන් රක්ෂණ ක්‍රමවලට පොළඹවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) ගබඩා රක්ෂණය තුළින් කෘෂිකාර්මිකයින්ට ස්ථාවරත්වය ලබා දීමට කටයුතු කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී ගබඩා 275 ක් රක්ෂණය කිරීමට අපේක්ෂා කර තිබුණ ද රක්ෂණය කර තිබුණේ ගබඩා 01 ක් වීමෙන් ආයතනයෙන් ලබාදිය යුතු සේවාව නිසි පරිදි ඉටු වී නොතිබුණි.

**(ආ) තෙවන පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රමය.**

කෘෂිකාර්මිකයන්ගේ තෙවන පාර්ශව රක්ෂණ අවශ්‍යතා ඉටුකිරීමේ යෝජනා ක්‍රමය යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 559 ට පත් කරනු ලබන නියෝජිතයින් මගින් එක් මධ්‍යස්ථානයකින් මාසිකව රු.50,000 බැගින් රු.27,950,000 ක ඉලක්ක ගත ආදායමක් අපේක්ෂා කර තිබුණද සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු.8,474,131 ක් විය. එහෙත් අනෙකුත් මෙහෙයුම් වියදම් අධික වීම හේතුවෙන් ශුද්ධ ආදායම රු.1,957,342 ක් වීමෙන් එහි ප්‍රතිලාභය ප්‍රමාණවත් මට්ටමක නොපවතින බව හා අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට ආයතනයට හැකි වී නොතිබුණු බවද නිරීක්ෂණය විය.

**(ඇ) විශේෂ බඩ ඉරිඟු ව්‍යාපෘතිය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක විශේෂ බඩ ඉරිඟු ව්‍යාපෘතිය සඳහා රු.1,350 ක්ව පැවති රක්ෂණ වාරික මුදල රු.750 ක් ලෙස සංශෝධනය කිරීම හේතුවෙන් ගොවීන් 5386 ක් වෙනුවෙන් අපේක්ෂා කළ රක්ෂණ ආදායම අහිමි වූ අතර, ආදායම ඉක්මවා රු.3,346,619 ක වන්දි ගෙවීමට ආයතනයට සිදුවී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------

දිස්ත්‍රික් කාර්යාල 12 ක පැවති වාහන අළුත්වැඩියා කර වාහන 08 ක් සංචිත වාහන ලෙස ප්‍රධාන කාර්යාලයේ රඳවා ගෙන තිබුණු අතර ඒ සඳහා රියදුරන් 04 දෙනෙක් පමණක් සේවයේ යොදවා තිබුණි. තවද දිස්ත්‍රික් කාර්යාලවල කාර්යාල රාජකාරි කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මාසිකව රු.30,000 ක කුලී ගෙවීම් පදනම මත වාහන ලබාගෙන ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,020,000 ක් ගෙවීම් කර තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-------------------------

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථාපිත කර තිබෙන කෘෂිකර්ම කාර්සාධන බලකාය වෙත අයහපත් කාලගුණය හේතුවෙන් ගොවි ජනතාවගේ වගාවලට සිදුවන ආපදාවන් දැනුම්දීම සඳහා 1918 තාක්ෂණික දුරකථන ඇමතුම් අංකයක් ලබාගැනීම වෙනුවෙන් රු.1,429,977 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී ඇමතුම් 276 ක් ආයතනය වෙත ලැබී ඇති අතර, ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන යාමට ආයතනය කටයුතු කර නොතිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු.**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2008 ජුනි 04 දින ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ජලාපවහන ගාස්තු වශයෙන් ගෙවා තිබූ රු.565,800 ක මුදල ව්‍යාපෘතිය අත්හැරීම නිසා අනාර්ථික වියදමක් විය. එය ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් දක්වා තිබිණි.

(ආ) රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් අනුග්‍රහය දැක්වූ මැලේසියාවේ පැවති කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් 2016 අප්‍රේල් 16 සිට 25 දින දක්වා පැවති සංචාරයකට සහභාගි වූ යෝජනා ක්‍රමයේ නිලධාරීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුට එකතුව රු.100,000 ක මුදලක් 2016 ජුලි 08 දිනැති අංක 474/13 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත ගෙවීම් කර තිබුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු.**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 හා 2016 වර්ෂවලදී සිදු වූ වාහන අනතුරු 4 ක් සම්බන්ධයෙන් එකතුව රු.194,604 ක මුදලක් රක්ෂණයෙන් ආවරණය කර ගත නොහැකි විය. 2015 දෙසැම්බර් 08 දින සිදු වූ වෑන් රථ අනතුරෙන් මාර්ගයට සිදු වූ හානිය වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියට රු.282,461 ක්ද ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වගන්තිය සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත් 16 වගන්තිය ප්‍රකාර එම අරමුදල් සඳහා දායකය ගණනය කිරීමේ දී ජීවන වියදම් දීමනාව ඇතුළත් කර ගණනය නොකිරීම හේතුවෙන් 2006 ජනවාරි සිට 2013 අප්‍රේල් දක්වා සේවකයාගේ හා සේව්‍යයාගේ හිඟ දායකය රු.29,409,723 ක් හා අධිභාරය රු.14,704,862 ක් ගෙවීම් කර තිබුණි.

**4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

ඇඹිලිපිටියේ පිහිටි නිල නිවාසයක අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කිරීමකින් තොරව වර්ෂ 30 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පවතී.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ආයතනයේ අනුමත තනතුරු 424 ක් පැවති අතර ඉන් තනතුරු නාම 12 ක පුරප්පාඩු 113 ක් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) අනාගත මානව සම්පත් අවශ්‍යතා සලකා බලා යෝජනා ක්‍රමය විසින් 2015 ජූලි 30 දින අනුමත කරන ලද සංශෝධිත කාර්ය මණ්ඩල හා බඳවා ගැනීම් සහ උසස් කිරීම් පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අදාල අනුමැතිය ලබා ගැනීමට විගණිත දිනය වූ 2017 මැයි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර තිබූ බඳවාගැනීම් පටිපාටියට අනුව ස්ථිර සහකාර අධ්‍යක්ෂ (අලෙවි) තනතුර සඳහා සුදුසුකම් ලෙස උපාධියක් හා වයස අවුරුදු 25 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතු බව දක්වා තිබුණද, අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල මත අවුරුදු 54 ක් වයසැති නිලධාරියෙකු ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීමකින් තොරව කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි.

(ඈ) තෙවැනි පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව හා මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ ව්‍යාපාර සංවර්ධන කළමනාකාර තනතුරු සඳහා නිලධාරීන් හතර දෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණි. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ඔවුන්ට මාසිකව රු.40,000 ක දීමනාවන්, රු.35,000 ක වාහන දීමනා, ලීටර් 250 කට සමාන ඉන්ධන දීමනාවන් හා එකතු කරන ලද ආදායමින් සියයට 0.5 ක කොමිස්ද වශයෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 4,482,919 ක් ගෙවීම් කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.**

**5.1 සංයුක්ත සැලැස්ම.**

2014 පෙබරවාරි 17 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/01/04 දරන රාජ්‍ය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයෙහි 5.1 (අ) ඡේදය ප්‍රකාරව පිළියෙල කරන ලද යෝජනා ක්‍රමයේ 2014 - 2016 සංයුක්ත සැලැස්මට හඳුනාගෙන තිබූ දුර්වලතා ඇගයීමට ලක් කර එම දුර්වලතාවයන් මඟ හැර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 5.2 (ඇ) ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය.**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 23 ත් සියයට 78 ත් අතර විචලනයන් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.3** **නොවිසඳී ඇති විගණන ඡේද.**

**------------------------------**

2016 පෙරවාරි 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ 13 වැනි රැස්වීම් වාර්තාව අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊ/අයිඑන්/ඒඒඅයිබී/සීඕපීඊ/2016 හා 2016 අගෝස්තු 31 දිනැති ලිපිය මඟින් ආයතනයේ නිලධාරින්ට අදාළ තනතුරට හිමි වැටුප් හා දීමනාවලට අමතරව වෙනත් දීමනාවක් ලබා ගත නොහැකි බව දන්වා තිබුණද එම නියෝගයට පටහැනිව 2016 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් විශේෂ දීමනාව වශයෙන් රු.521,928ක් ද ගොවි විශ්‍රාම වැටුප් විශේෂ දීමනා වශයෙන් රු.772,550 ක්ද රක්ෂණ කොමිස් හා දිරිදීමනා ලෙස රු.9,950,591 ක්ද ගෙවා තිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

**----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ආදායම් හඳුනාගැනීමේ දුර්වලතා පැවතීම. |
| (ආ) | ආදායම් පාලනය | (i) ආදායම් එකතු කර ගැනීමේ ක්‍රමවේදය අනුමත පද්ධතිය සමඟ අනුකූල නොවීම.<br>(ii) ලැබිය යුතු ශේෂ අය කරගැනීමේ දුර්වලතා. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | වත්කම් ඌන ලෙස උපයෝජනය කිරීම. |
| (ඈ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | අනුමත නොවූ පත්කිරීම් සහ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයක් පැවතීම. |
| (ඉ) | මූල්‍ය පාලනය | (i) සීමාවන් ඉක්මවා අත්තිකාරම් ලබාදීම.<br>(ii) ලබාගත් අත්තිකාරම් පියවා ඇතිද යන්න නොසලකා තවදුරටත් අත්තිකාරම් ලබාදීම. |